"ජලය මානව හිමිකමකි - සුව රැකුම අභිමානයකි"

# ජල සම්පාදන අමාත්‍යාංශය

## ලෝක බැංකුවේ සහය ලබන ජලසම්පාදනය හා සනීපාරක්ෂකතාව වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය (WaSSIP)

**ණය අංක : Cr. 5685-lk**

# ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම සඳහා පුරප්පාඩු

ලෝක බැංකු සහය ලබන ජල සම්පාදනය හා සනීපාරක්ෂකතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP), මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සනීපාරක්ෂකතාව වැඩිදියුණු කිරීම හා නළගත ජල ප්‍රවේශ සේවාවන් වැඩිදියුණු කිරීම හා පාතිය ජල අංශයේ ආයතනවල ශක්‍යතාව / ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ කාර්යාලය, කොළඹ හි ස්ථාපිත කර ඇති අතර, දිස්ත්‍රික්ක ආධාරක ඒකක, එක් එක් දිස්ත්‍රික්කයක එකක් (01) බැගින්, ස්ථාපිත කරනු ලැබ ඇත. සමස්ත ව්‍යාපෘතියේ **මුළු පිරිවැය ඇ.එ.ජ. ඩොලර් මිලියන 223 කි.**

පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් සතුව පහත සඳහන් අවම සුදුසුකම් තිබිය යුතුය.

## ඉංජිනේරු තනතුර (PS 4)

**ස්ථානය :**

දිස්ත්‍රික්ක ආධාරක ඒකක

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

02. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් සමග ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හි ආශ්‍රිත සාමාජිකත්වය.

ජල සම්පාදන හා සනීපාරක්ෂකතාව හා අදාළ කටයුතුවල පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

## ඉංජිනේරු සහකාර (PS 6)

**ස්ථානය :**

දිස්ත්‍රික්ක ආධාරක ඒකක

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. සිවිල් / යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**හෝ**

02. සිවිල් / යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අඩුම තරමින් වසර 04 ක පළපුරුද්ද

**හෝ**

03. සිවිල් / යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

අඩුම තරමින් වසර 09 ක පළපුරුද්ද.

ජල සම්පාදන හා සනීපාරක්ෂකතාවයට අදාළ කටයුතුවල පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

## කණිෂ්ඨ තාක්ෂණ නිලධාරී (MN 2 ශ්‍රේණිය III)

**ස්ථානය :**

දිස්ත්‍රික්ක ආධාරක ඒකක

**සුදුසුකම් :**

ජාතික තාක්ෂණවේද සහතිකය සිවිල් හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම

**හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ, පහත වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**හෝ**

වෙනත් අදාළ සුදුසුකම්

ජලසම්පාදන ව්‍යාපෘතිවලට අදාළ කටයුතුවල ඉදිකිරීම් අධීක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

**ඉහත සඳහන් තනතුරු සඳහා පොදු කොන්දේසි :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

වැටුප්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2019/01 මත පදනම් වනු ඇත.

**සේවා නියමයන් හා කොන්දේසි :**

පත්වීම් මූලිකව එක් වසරක කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම මත වනු ඇති අතර, සතුටුදායක කාර්ය සාධන ඇගයීම මත නැවත වාර්ෂිකව අලුත් කරවා ගත හැකිය. කළමනාකරණ සේවා චක්‍රලේඛ 2019/01 හි සඳහන් සියලු කොන්දේසි පත්වීමට අදාළ වනු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

උසස් හා ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව, කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීකෂණයකට කැඳවනු ලබන අතර, තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය මත පදනම්ව සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් සිය ජීව දත්ත තොරතුරු සමග අයදුම්පතේ, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද හා පෙර / පසුගිය සේවා වාර්තා ආදිය පිළිබඳ සියලු සහතිකපත්‍රවල පිටපත්ද සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට **ලැබෙනසේ 2021 අගෝස්තු 09 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ** එවිය යුතුය.

අයදුම් කරනු ලබන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ / සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**ජල සම්පාදනය හා සනීපාරක්ෂකතාව වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය,**
**අංක 230, ඊ.ඩබ්ලිව්. පෙරේරා මාවත, ජුබිලි කණුව, නුගේගොඩ.**